The First Sri Lankan Book
Produced In
Print, Audio And Braille Forms

# දූවිලි

සත්‍යා නිර්මාණී

Sera Audio Books

# දූවිලි
(කෙටි කතා සංග්‍රහය)

**සත්‍යා නිර්මාණී**

ශ්‍රී ලංකාවේ දී ප්‍රථම වරට
මුද්‍රිත, බ්‍රේල් සහ ශ්‍රව්‍ය කෘති වශයෙන්
Sera Audio Books මගින්
2022 වසරේ දී මුද්‍රණය කර එළිදක්වන ලදි.

© Sera Audio Books

ISBN 978-624-99697-0-4

සියලුම හිමිකම් ඇවිරිණි.

Sera Audio Books හි පූර්ව අවසරයකින් තොරව මෙම මුද්‍රිත, ශ්‍රව්‍ය හා බ්‍රේල් ග්‍රන්ථ සම්පූර්ණයෙන් ම හෝ ඒවායින් කොටසක් හෝ උපුටා ගැනීම, මුද්‍රිත, ලිඛිත, ඉලෙක්ට්‍රොනික ආදී කවර මාධ්‍යයකින් හෝ පිටපත් කිරීම, පළ කිරීම, විකාශනය කිරීම, අනුවර්තනය කිරීම හා ව්‍යාජ ලෙස සැකැසූ පිටපත් අලෙවි කිරීම සම්පූර්ණයෙන් ම තහනම් වේ.

මුද්‍රණ සැලැසුම: **වාක්‍යා රූ**

සංස්කරණය සහ කවර සැලසුම: **මේනකා ජයසුන්දර**

ශ්‍රවණ කෘතියේ හඬ දායකත්වය: **තිළිණ සමරසූරිය / දේශානි වීරසිංහ**

ශ්‍රවණ කෘතියේ සංස්කරණය /බ්‍රේල් කෘතියේ මුද්‍රණ සැලැසුම /
බ්‍රේල් කෘතිය මුද්‍රණය
**කසුන් නයනජිත්**

ප්‍රකාශනය
**Sera Audio Books**
Youtube (Sera Audio Books)
Facebook : Seraaudiobooksfacebookpage
Email : sera.audio.books.fr@gmail.com

මුද්‍රණය:
**සුසර පබ්ලිකේෂන්**
අංක 338/A, ගෝනහේන පාර, කඩවත

# පිදුම

පාට තැවරුණු
සොඳුරු ලෝකය
දකින්නට මට
දැස වූ
ඔබට!

# තුති!

ජීවිතයේ මේ දක්වා ආ ගමන් මගෙහි මට අත්වැලක් වූ, සෙවණැල්ලක් වූ පිරිස බොහෝ ය. ඒ කිසිවෙක් හෝ කිසිවක් අමතක කළ නොහැකි අතර මේ මොහොතේ ඔවුන් සිහිපත් කිරීම ඒ සියල්ලන්ට ම කරන්නා වූ ගෞරවයක් බව මා දැඩිව විශ්වාස කරන්නකි.

පළමුව මා මෙලොවට බිහි කර මා ඇති දැඩි කිරීමෙන් පමණක් නොනැවතී, මා දෑසින් නොදකිනා ලෝකය ඔවුන්ගේ දෑසින් මට පෙන්වන මගේ ආදරණීය අම්මා මල්ලිකා සහ අප්පච්චි ගාමිණී යන දෙපළට වඳිනින් තුති පුදා මඳ බව දනිමි. එහෙත් මුල් තැන ඔබට යි. අද මා ඉන්නා තැනට මා ඔසවාගෙන ආවේ ඔබ ය.

කුඩා කල සිට සොයුරෙකු පමණක් නොව මිතුරෙකු ද වූ, මා ළඟ ම හිඳ ඔබත් සමග ම අත්වැල් අල්ලා යන්නට ළමා පොතපත කියවූ ආදර සොයුර සචිත්‍ර, ඔබට මතක ද ඒ දවස්? ස්තුතියි ඒ හැම දේට ම. ඉසුරිණිමා, ඔබේ ළං වීමත් සතුටක්. ස්තුතියි ඔබටත්. එමෙන් ම පෙර පාසැල, ප්‍රාථමික අධ්‍යාපනය ලැබූ දොලුව මහා විද්‍යාලය සහ ජීවිතයේ වෙනස් හැඩයක් පෙන්වූ රත්මලාන අන්ධ විද්‍යාලය සහ මහනුවර පුෂ්පදාන බාලිකා ජාතික පාසල තුළින් මට ළං වූ, මට දෑසක් වූ ගුරු මෑණිවරුන්, පියවරුන් සහ ආදරණීය සොයුරු සොයුරියනි,

නම් වශයෙන් සිහිපත් නොකළත් ඔබ සියලුදෙනා මගේ සිත් කොනක සදා නොමැකෙන ලෙස ලැගුම් ගෙන ඇත. මේ කතා තුළ ඔබත්, ඔබේ වචනත් ජීවත් වන්නේ ය. ඉදින් ඔබට ස්තුති නොකර කොහොම ද?

සුජානි, දුල්මිණී, පියුමිණී, නිකේශලා මගේ ඥාති සොයුරියනි, තනිව පොතපත කියවා නොගෙන මටත් ඇසෙන්නට කියවමින් ඒ රසය, ඒ අද්දැකීම් මා හා බෙදා ගත් ඔබ, මට කිසි විටෙක අමතක කළ නොහැකි ය. විශ්වවිද්‍යාලය තුළ ඉගෙනගත් සිවු වසර තුළ මා වෙත මිත්‍රත්වයේ දෑත දිගු කළ, තවමත් දුක සැප විමසන මිතුරු මිතුරියනි, මෙහි බහුතරයක් ඇත්තේ ඔබ මට කියූ කතා ය. ඔබේ අද්දැකීම් ය. ඉදින් මේ අත්දැකීම් මා හට සමීප කළ ඔබත්, ඉන් පසු විශ්වවිද්‍යාලය තුළ මෙතෙක් මා සේවය කරන විට හමු වූ, ළං වූ විද්‍යාර්ථීනුත් සිහිපත් කරන්නේ තුති පිරි හදවතින් ය.

එදා මෙදා තුර විශ්වවිද්‍යාලය තුළ හමු වූ මග පෙන්වූ ඇදුරු මඬුල්ල අපමණ ය. නම් වශයෙන් නොකියන්නේ එක් අයෙකු හෝ බැරි වීම වරදක් හෙයිනි. එබැවින් පොදුවේ සියලු දෙනා සිහිපත් කරනුයේ ඉමහත් ගෞරවයෙන් ය.

සිංහල උපාධියක් හැදෑරීමේ අදහස පසුව වෙනස් වුවත් එය ලේඛකත්ව හා සන්නිවේදන පශ්චාත් උපාධිය හැදෑරීමෙන් පූර්ණ වූ අතර ඊට මග පෙන්වූ රත්නසිරි අරංගල මහාචාර්යතුමනි, මගේ නිබන්ධන පර්යේෂකවරිය වූ ජයලතා මැදවත්ත ආචාර්යතුමියනි, ඔබ දෙපළට මගේ හදපිරි තුති පුදමි.

එසේම පාඨමාලාවෙන් හමු වූ දිලනි අක්කාට සහ මුල් කෘතියේ සෝදුපත් බලමින් මට සහාය වූ වර්ශා, භාග්‍යා, අරුන්දි යන සොයුරියන්ට ද මගේ ප්‍රණාමය.

මාගේ නිර්මාණකරණය පහසු කරවූයේ මා ලැබූ පරිගණක අධ්‍යාපනයයි. ඒ සඳහා මා යොමු කළ මගේ ප්‍රථම පරිගණක ගුරුවරයා වූ කැලුම් ප්‍රසන්න මහතාත් විශ්වවිද්‍යාලයේ පරිගණක ආචාර්යවරයා වූ චානක වාසනා මහතාත් සිහිපත් කරන්නේ ඉමහත් භක්ත්‍යාදරයෙනි.

'අහසින් එහා' බ්ලොග් අඩවිය නිර්මාණය කරමින් ලේඛිකාවක වීමට මග හසර හෙළි පෙහෙළි කර දුන් එදා පෙම්වතා, අද සැමියා වන කසුන් නයනජිත් ඔබටත්, ජීවිතයට අලුත් බලාපොරොත්තුවක් කැටි කළ දයාබර දියණිය සෙතුලි සවර්ශා ඔබටත් හදවතින් තුති පුදමි. එසේ ම බ්ලොග් අවකාශය තුළ හමු වූ මගේ ම සොයුරු කැලක් ලෙසින් මේ මොහොතෙත් ළඟින් හිඳිනා ඔබ, නම් වශයෙන් නොකීව ද මේ ස්තුතිය ඔබට යි. මන්ද අපූරු වූ මිනිසුන් රැසක් ළං වූ ඒ අවකාශය මේ සියල්ලට මුල සිට ශක්තියක් විය.

අවසාන වශයෙන් මගේ හීනය පාට කළ, මගේ හීනයට පණ දුන් ඇයට! මේ කෘතිය අද ඔබ අතට පත් වන්නේ ඇය නිසා ය. ශ්‍රී ලංකාවේ ග්‍රන්ථකරණයේ කඩඉමක් සනිටුහන් කරමින් මුද්‍රිත, ශ්‍රව්‍ය සහ බ්‍රේල් කෘති වශයෙන් 'දූවිලි' කෙටිකතා සංග්‍රහය එළිදක්වන Sera Audio Books නිර්මාතෘ මේනකා ජයසුන්දර සොයුරියනි, ඔබට තුති පිදීමට තරම් අකුරු හෝ වදන් මට නැත. හද පත්ලෙන් පැනනගින ආදරය පමණක් ඔබට පුද කරමි.

ස්තුතියි!

**සත්‍යා නිර්මාණි**
2022 නොවැම්බර් 08 වැනි දින
කොළඹ දී.

# ලංකාවේ දී අපට හමු වන පළමුවැනි දෘශ්‍යාබාධිත කෙටිකතා රචිකාව ඇයයි!

කෙටිකතාව නමැති විචිත්‍ර සාහිත්‍ය ප්‍රවර්ගය මානව ජීවිතයේ ස්වභාවය විවිධාකාරයෙන් ප්‍රතිනිර්මාණය කරයි. සාහිත්‍ය නිර්මාණයත්, මානව සමාජයත් අතර මැද එක් මොහොතක ලේඛකයාත්, පාඨකයාත් මුහුණට මුහුණ මුණගැසේ. එය අපූරු හෘදයසංවාදී නිමේෂයකි. කෙටිකතාව ද මෙකී විශිෂ්ට අත්දැකීම කොන්දේසි විරහිතව පාඨකයා වෙත ප්‍රදානය කරයි. සත්‍යා මනසින් දකින ලෝකය කෙටිකතා අවකාශයෙහි ප්‍රතිනිර්මාණය කිරීම සුවිශේෂී ලක්ෂණයකි; අවස්ථාවකි.

ඇගේ කෙටිකතාවල හමු වන සජීවී චරිත මගින් තියුණු නිරීක්ෂණ ශක්තියෙන් හා සියුම් ප්‍රතිභාවෙන් යුත් ලේඛිකාවකගේ ආගමනය සනිටුහන් කෙරේ.

සිංහල කෙටිකතා ලේඛිකාවන්ගේ නාමාවලිය ඇරඹෙන්නේ ඊවා රණවීරගේ "මොරකැටි" (1960) කෙටිකතා සංග්‍රහය පළ වීමත් සමග ය. සිංහල කෙටිකතා කලාවේ ප්‍රගමනය උදෙසා ලේඛකයන්ගේ දායකත්වයට සාපේක්ෂව ලේඛිකාවන්ගේ දායකත්වය අවම අගයක් ගනියි. මෙකී ලේඛිකා නාමාවලියෙහි සත්‍යාගේ නම සටහන් වන්නේ සුවිශේෂී ලේඛිකාවක වශයෙනි. ඇය අපට හමු වන පළමුවැනි දෘශ්‍යාබාධිත කෙටිකතා රචිකාව යි.

ඇගේ නිර්මාණ භාවිතයේ කැපීපෙනෙන ලක්ෂණ කිහිපයකි. ඇස ගැටෙන අද්දැකීම් නිර්මාණ මගින් විඳ ගැනීමට හුරුපුරුදු පාඨකයා සත්‍යාගේ මනසින් ගැටෙන අත්දැකීම්වල ගැඹුරු මෙන් ම සත්‍යවාදී බවින් ද තිගැස්මට ලක් වේ. ඇස පිනවන ලෝකයේ ව්‍යාජය පසක් කර ගනී. සරල කතා රටාවකින් ඉදිරිපත් වන සත්‍යාගේ කෙටිකතා සමාජ ක්‍රියාකාරීත්වයේ හෘදය ස්පන්දනය සියුම්ව ග්‍රහණය කර ගනී. මෙම කෙටිකතාවල පළමුවන පාඨකයා බවට පත් වීමට හැකි වීම මා ලද භාග්‍යයක් බව සඳහන් කරමින්, සත්‍යාගේ කෙටිකතා කලාව නව මංපෙත් ඔස්සේ ඉදිරියට ගමන් කරනු දැකීමේ අපේක්ෂා පෙරදැරිව සුභපැතුම් එක් කරමි.

**ආචාර්ය ජයලතා මැදවත්ත**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
සිංහල අධ්‍යයන අංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

2022 නොවැම්බර් 08

# සිහින දකින එක
# නතර කරන්න එපා!

2020 වසරේ ජූනි 22 වැනිදා නිල වශයෙන් Sera Audio Books යූටියුබ් නාලිකාව ආරම්භ වෙනවා. එතැන් පටන් ක්‍රම ක්‍රමයෙන් පොත් අහන්නට කැමැති පිරිස් වගේ ම පොත් කියවන්නට නොහැකි දෘශ්‍ය ආබාධ සහ දෘශ්‍ය ඌනතා සහිත විශාල පිරිසක් අපිත් එක්ක එකතු වෙනවා සහ මට ඔවුන් සමග බොහොම සමීපව ඇසුරු කරන්නටත් කතාබහ කරන්නටත් අවස්ථාව ලැබෙනවා. ඒ අවස්ථාවන්වල දී නිරීක්ෂණය කරන්නට ලැබුණු දෙයක් තමයි ඔවුන් අතර ලේඛනයෙහි අතිදක්ෂ පිරිසක් ඉන්නවා ය කියන කාරණය. ඉතින් 2021 වසරේ දී අපි ඔවුන්ට ආරාධනා කරනවා, යෝජනා කරනවා ඔවුන්ගේ නිර්මාණ Sera Audio Books අපට එවන්නට ය කියලා. ඒ අනුව නිර්මාණ විශාල ප්‍රමාණයක් ලැබුණා. තවමත් ලැබෙමින් පවතිනවා. ඒ අතරින් තෝරාගත් කවි සහ කෙටි කතා සංග්‍රහයන් කිහිපයක් එළිදක්වන්නට යි අපි සැලසුම් කර තිබුණේ.

එහි පළමු පියවර වශයෙන් සත්‍යා නිර්මාණි විසින් රචිත කෙටි කතා දහයක් අද 'දූවිලි' නමින් ඔබ අතට පත් වෙනවා. මුද්‍රිත, ශ්‍රව්‍ය සහ බ්‍රේල් කෘති වශයෙන්. මේ ආකාර තුනෙන් ම කෘතියක් එළිදැක්වෙන්නෙ ලංකාවේ පළමුවැනි වරට යි. එමෙන් ම සත්‍යා නිර්මාණි කෙටිකතා පොතක් එළි දක්වන ලංකාවේ පළමුවැනි දෘශ්‍යාබාධිත ලේඛිකාව බවටත් අද පත් වෙනවා.

කවදා හෝ ඉතිහාසය ලියන්නන් විසින් මේ කරුණු මගහැර යැමට තිබෙන ඉඩකඩ වැඩි යි. නමුත් අද සුවිශේෂී දවසක්. මේ සියල්ල සඳහා පෙරමුණ ගන්නට ලැබීම ගැන මට දැනෙන්නේ නිහතමානී ආඩම්බරයක්.

Sera Audio Books කියන්නේ මගේ හීනයක්. හැබෑ කරගත්ත හීනයක්. මගේ හීනය හැබෑ කරගෙන යන මේ ගමනේ දී තවත් කෙනෙකුගේ හීනයක් හැබෑ කරවන්නට ලැබීම ගැනත් මට දැනෙන්නේ අප්‍රමාණ වූ සතුටක්.

සත්‍යාට හීන ගොඩක් තිබුණා. මීට කාලෙකට කලින් සත්‍යා කියපු කතාවක් බොහොම බරට මගේ හදවතේ තැන්පත් වෙලා තියෙනවා. සත්‍යා කිව්වා 'මගේ ලොකුම හීනය තමයි මගේ ඇස් දෙකෙන් එකම එක වතාවකට හරි මගේ දුවගේ මුහුණ බලාගන්න එක' කියලා. අම්මා කෙනෙක් විදියට, දුවෙක් ඉන්න අම්මා කෙනෙක් විදියට, ඉපදුණ දවසේ ඉඳලා දවසින් දවස තරුණියක බවට පත්වන දුවක දිහා ඇස් දෙකෙන් බලාගෙන ඉන්න අම්මා කෙනෙක් විදියට සත්‍යාගේ ඒ හීනය මට බොහොම බරපතළ විදියට දැනුණා. සත්‍යාගේ ඒ හීනය හැබෑ කරවන්නට මට බැරි බවත් මම දන්නවා. නමුත් සත්‍යාගේ සමහර හීන හැබෑ කරගන්නට පුංචි තල්ලුවක් දෙන්න මට පුළුවන්. අද මේ හැබෑ වෙන්නේ සත්‍යාගේ ඒ වගේ තව හීනයක්. කසුන්ගේ හීනයක්. මගේ හීනයක්. Sera Audio Books අපේ හීනයක්.

ජීවිතේ සියල්ල අහිමිව ගිය මොහොතවල්වල පවා අපව ජීවත් කරවන්නේ අපේ සිහින. තව මොහොතක් හෝ ජීවත් වන්නට අපට බලාපොරොත්තුවක් දෙන්නේ අපේ සිහින. ඒ නිසා සිහින දකින එක නතර කරන්න එපා.

අද මගේ හීන, සත්‍යාගේ හීන හැබෑ වුණා වගේ හෙට දවසේ දී ඔබ බොහෝ දෙනෙකුගේ හීන හැබෑ වීමට නියමිත යි. ඒ නිසා සිහින දකින එක නතර කරන්නට එපා.

අපේ හීන පසුපස්සෙ විතරක් ම හැල්මේ දුවන්නේ නැතුව ඒ හීන හැබෑ කර ගන්නට යන ගමනේ අතරමග දී අපට

මුණගැහෙන තවත් එකෙකු හෝ දෙන්නෙකුගේ වත් හීන හැබෑ කර ගන්නට යහපත් මනුෂ්‍යයන් විදියට පුංචි හරි දායකත්වයක් දෙන්න පුළුවන් නම් මේ ලෝකය මේ තියෙනවාට වඩා තවත් දශමයකින් හෝ සුන්දර තැනක් බවට පත් වේවි.

හැබෑ වුණත් නැතත් සමහර හීන හරි සුන්දරයි. ඒ නිසා සිහින දකින එක නතර කරන්න එපා!

සත්‍යාගේ හීනය හැබෑවක් කරන්නට මට සහාය වූ සියලු දෙනා ම මේ අවස්ථාවේ සිහිපත් කරන්නේ බොහොම ගෞරවයෙන්. පොතේ පිටු සැකසූ සේනාත් ඉන්ද්‍රජිත්, සෝදුපත් බැලූ ජයසිරි ජයසේකර, ශ්‍රවණ කෘතියේ හඬ දායකත්වය ලබාදුන් තිළිණ සමරසූරිය සහ දේශානි වීරසිංහ, බ්‍රේල් කෘතියේ සංස්කරණය, බ්‍රේල් කෘතියේ මුද්‍රණය, ශ්‍රවණ කෘතියේ සංස්කරණය කළ කසුන් නයනජිත්, මුද්‍රණය දක්වා නිවැරදි මග පෙන්වූ ඉන්දික ලොකකලුගේ නොසිටින්නට 'දූවිලි' මෙතරම් ඉක්මණින් යථාර්ථයක් බවට පත් කරන්නට නොහැකි වන්නට ඉඩ තිබිණ.

දිරි දුන් ඔබ සැමට තුති !

**මේනකා ජයසුන්දර**
Founder / Sera Audio Books
2022 නොවැම්බර් 08 වැනි දින
පැරිසියේ දී.

# පටුන


| | | |
|---|---|---|
| | තුති! | 5 |
| | ලංකාවේ දී අපට හමු වන පළමුවැනි දෘශ්‍යාබාධිත කෙටිකතා රචිකාව ඇයයි! | 9 |
| | සිහින දකින එක නතර කරන්න එපා! | 11 |
| 1. | ආදරය, මිත්‍රත්වය හා නරි | 17 |
| 2 | අඳුර | 23 |
| 3 | අවුරුදු නිවාඩු | 30 |
| 4 | වතුර | 39 |
| 5 | දූවිලි | 47 |
| 6 | බිබිලි | 60 |
| 7 | දැන්වීමක් | 64 |
| 8 | කොළඹ අහස යට | 69 |
| 9 | ගැනු සත්තු | 77 |
| 10 | ගිලිහුණු අත් වැල් | 85 |

# 1

# ආදරය, මිත්‍රත්වය හා නරි

"කඳුළු දෙන්න මට හඬන්න
සත් සමුදුර ගොඩ ගලන්න
සුසුම් දෙන්න මට හෙළන්න
සක්වල ගල සසල වන්න"

සුනිල් එදිරිසිංහයන් එසේ ගායනා කර අවසන් වන විට දෑසේ නැඟි කඳුළු පොරෝනාවේ කොනකින් පිස දමාගෙන දෑස හැර ගත්තෙමි. වහලේ තහඩුවක ඇති කුඩා සිදුරකින් සඳ එළිය කාමරය තුළට ගලා එයි. ඉන් මන්දාලෝකයක් කාමරය තුළ විය. දැන් වේලාව රාත්‍රී එකොළහ පසු වී විනාඩි තිහයි. නිවේදක තැන එසේ කියන විට කොතෙක් වේලා මා අතීතය තුළ සැරිසරා ඇත් දැයි සිහි විය. දැන් රේඩියෝ වැඩසටහනේ පසුබිමෙන් වාදනය වන්නේ සිහින් වස්දඬු රාවයකි. එය අපූරු සංගීත ඛණ්ඩයකි. ඒ සංගීතය ඇසූ දා සිට මා එයට ආශා කරන අතර ඒ සංගීතයත් සමග මට දැනෙන්නේ ඈතට පා වී යන ස්වභාවයකි. ඒත් සමග හදවතට දැනෙන්නේ පාළුව ද තනිකම ද එසේත් නැති නම් කියා ගත නොහැකි සෞන්දර්යාත්මක හැඟීමක් දැ යි මට පැහැදිලි නැත.

මෙතෙක් වේලා ජංගම දුරකථනයෙන් රේඩියෝව අසා උන් මම එය පසෙකින් තබා ජනේලය අසලට ගොස් එය විවර

කෙරුවෙමි. මට අවශ්‍ය වූයේ සඳ එළියෙන් ආලෝකමත් වී ඇති හාත්පස දැක ගැනීමට ය. ඈතින් ඈතට විහිදී ඇති වෙල් යාය දැක ගැනීමට ය. නමුත් ජනේලය ඉදිරියේ වූ උගුරැස්ස, අඹ, වැටමාර සහ වෙනත් පඳුරුවලින් ඒ සියල්ල වසාගෙන අඳුරක් පතුරවමින් තිබිණි.

ජනේලය අසලින් මෑත් වූ මම ශබ්ද නොනැගෙන සේ ඇඟිලි තුඩින් ඇවිද සාලයට ගොස් ඉදිරි දොර හැර මිදුලට බැස්සෙමි.

මෙතෙක් වේලා ගිරි ශිඛර වෙල් යාය අතරේ දඟ දුන් සීත සුළඟ එක්වර ම අවුත් මා වැලඳ ගත්තේ ය. මට දැනුණේ මහත් සහනයකි. දින ගණනක් මා විඳි මානසික පීඩාව ගෙදර ආ මොහොතේ සිට මඳින් මඳ අඩු වෙමින් තිබුණත් ඒ සියල්ල එක් වර ම සිත තුළ නැගී සිටින්නේ දිය යට එබූ රබර් බෝලයක් උඩ මතු වන්නා සේ ය.

ආකාසේ පළින් පළ තාරුකා දිදුලමින් තිබුණේ පූර්ණ චන්ද්‍රයා ද පිරිවරාගෙන ය. ඈත කඳු අතරේ පුංචි පුංචි එළි දැල්වුණු අතර ඉන් මාගේ කුඩා කාලය මට සිහි විය. ඒ නිවෙස්වල කවුරුන් ඉන්නවා ඇති ද? ඔවුන් මේ වේලාවේ කුමක් කරනවා ඇති ද? කුඩා කාලේ මෙවන් එළි දෙස බලමින් මම අම්මාගෙන් හෝ අප්පච්චිගෙන් අසමි. අද මම තනියෙන් ඒ එළි ප්‍රශ්න කරමි. හිටිහැටියේ යළිත් වරක් ඔවුහු මගේ හදවතින් එබී බලති. එක් පසෙකින් තාරකා ය. අනෙක් පසින් ප්‍රසන්න ය. ආදරය සහ මිත්‍රත්වය. හදවතේ දෙපසින් මට අතීතයේ ආදරය සහ මිත්‍රත්වය යළිත් වරක් සිහි විය. වෙල් යායේ ඉහළ සිට නියර දිගේ කවුරුන් හෝ පිරිසක් එනු මට පෙනුණි. මේ රාත්‍රියේ කවුරුන් කොහේ යනවා දැ යි මම කල්පනා කරන්නට වීමි. මඳක් ඉදිරියට ගොස් බැලූ මට ඒ කවුදැයි වැටහිණි. ඔව්, ඒ ඔවුන්ය. නරි! නරි ගඟ දෙසට දුව යමින් සිටිති. කුඩා කාලේ සිට අසා ඇති පරිදි කපටි කෛරාටික නරි! නමුත් ඔවුන් මිනිසුන්ට වඩා කපටි ද?

ප්‍රසන්න සාමාන්‍ය පෙළ කාලයේ සිට මගේ හොඳම මිතුරා විය. සාමාන්‍ය පෙළ සිට උසස් පෙළ හැදෑරුවේ ද අප දෙදෙනා එකට ම ය. පසුව අප එක ම විශ්වවිද්‍යාලයට තේරුණු අතර දෙවන වසරේ සිට දෙදෙනා ම එක ම විශේෂවේදී උපාධිය ද හැදෑරුවෙමු. සහෝදරයෙකු නොමැති මට ඔහු සහෝදරයෙක් විය. ඔහු කීවේ ද එසේ ය. විශ්වවිද්‍යාලයේ සිටි වසර හතර තුළ නේවාසිකාගාරයේ එකට ම උන් අප සොයුරන් බව කවුරුත් සිතූහ. විශ්වවිද්‍යාල අධ්‍යාපනය අවසන් වූ පසු අප දෙදෙනාට ම එහි සහාය කථිකාචාර්ය තනතුරු දෙකක් හිමි විය. මෙතෙක් කල් එක ම බෝඩින් කාමරයේ එකම ඇඳේ උන් ඔහු, එක බත් පත බෙදා කෑ ඔහු, හිටිහැටියේ වෙනස් වන්නට විය. බෝඩින් කාමරයෙන් ඔහු ඉවත් වී යන දවසේ, සහෝදරයෙක් ඈත් වී යන විප්‍රයෝගය මට දැනුණි.

අප දෙදෙනා ම එක් වී සැකසූ පර්යේෂණ පත්‍රිකා කිහිපයක් ඔහු මටත් හොරා වෙනත් පර්යේෂණවලට ඉදිරිපත් කර ඇත. මට දැනුණේ මහත් දුකකි. ඊටත් වඩා වේදනාකාරී ම දේ වූයේ ඊට පසුව ය. අපගේ ආචාර්යවරුන්ට ඔහු මා පිළිබඳ ව විවිධ කේලාම් කියන බව මට දැනගන්නට ලැබුණු අතර මගෙන් විවිධ අතපසු වීම් වන බවට ද ඔහු චෝදනා කරන්නට වූයේ ය. ආචාර්යවරුන්ට මා පිළිබඳ විශ්වාස වූ නමුත් එය මට මහත් කලකිරීමක් ගෙන ඒමට හේතුවක් විය. ඔහු මෙසේ කරන්නේ ඇයි දැයි මට සිතාගත නොහැකි විය. මේ පිළිබඳ ව ඔහුගෙන් අසන බව මා මට ම දිවුරා, අසනා දෑ පෙළගස්වා ගෙන පසු දා ගියත් මට කිසිවක් ඇසිය නොහැකි විය. තාරකා කියන ලෙස මට කොන්දක් නැති දැයි මට ද ඒ වේලාවට සිතේ.

“හුක්කි හුක්කි හූ”

ගඟ දෙසට ගිය නරින් හූ කියනු ඇසේ.

තාරකා මට ආදරය කළ, මා ආදරය කළ පළමු තරුණිය යි. විශ්වවිද්‍යාලයට ගිය පළමු වසරේ සිට ඈ මගේ හොඳ ම මිතුරිය වූවා ය. ගමේ ගොස් එන සෑම දිනක ම ඇය මට බත්

මුලක් සහ වෙනත් රස කැවිලි ගෙනවුත් දුන්නී ය. පසුගිය සතිය වන තුරු දිනපතා ම පාහේ මට බත් උයාපිහා ගෙනවුත් දුන්නී ය. මට අවශ්‍ය සටහන් සොයා දෙමින් මගේ අධ්‍යයන කටයුතුවලට ද සහාය දුන්නී ය. මා ද මට හැකි සෑම විට ම ඇයගේ අධ්‍යාපන කටයුතුවලට සහාය දුන් අතර විශ්වවිද්‍යාලයේ වෙනත් පෙම්වතුන් මෙන් මම ඇයගේ ආත්මය තළා පොඩි කර නොදැම්මෙමි. මම ඇයව ආරක්ෂා කළෙමි.

විශ්වවිද්‍යාලයෙන් ඉවත් වූ වහා ඇයට රජයේ රැකියාවක් ලැබුණු අතර එය දේශපාලන සහයෝගයකින් ලද රැකියාවක් බව මම දැන උන්නෙමි. මා ඊට අකමැති වූ අතර මුල් දිනවල ඒ සම්බන්ධයෙන් අප දෙදෙනා අතර ගැටලුකාරී තත්ත්වයන් ද ඇති විය. නමුත් එය ඇයගේ නිවසේ බලපෑමක් බව මට දැනගන්නට ලැබුණි. තාරකා රූපයෙන් ද තාරකාවකි. සුන්දර ය. ඒ වාගේ ම මට ඇය අහසේ ඇති තාරකාවක් ලෙස පෙර සිට දැනුණේ අපගේ සමාජ ආර්ථික පසුබිම ගැන කල්පනා කරන විට ය. මම ඒ බව ඇයට කී විට ඇයටවත් නිවැසියන්ටවත් එය ගැටලුවක් නො වන බව ඈ කීවා ය. දැන් වසරක සිට ඇයට අවශ්‍ය වූයේ විවාහ වීමට ය. ඒ සෑම අවස්ථාවකම මම ඇයට මගේ පසුබිම යළි යළිත් පැහැදිලි කර සිටියෙමි.

"තාරකා ඔයා දන්නව නේ මේ රස්සාව තාවකාලික එකක්. කොයි වෙලාවේ නැති වෙයි ද දන්නෑ. එහෙම වුණොත් ජොබ් එකක් හොයා ගන්න ඕනේ. කොහොමත් තව ටික දවසයි. ඒ නිසා මං ජොබ් එකක් හොයනවා."

"ඉතින් ඒක තමයි මං ඔයාට කිව්වේ තාත්තිට කියලා මිනිස්ටර් ළඟට යමු කියලා. මටත් වඩා ඔයාට කොලිෆිකේෂන්ස් තියෙනවා නේ."

"මං ඒකට කැමති නෑ."

"ඔයාගේ ලොකුකම නේ සදීප්, අද කාලේ එහෙම නැතුව බෑ."

ඇ෴ මට කියන්නීය.

"ඒ විතරක් නෙවෙයි. අක්කව බන්දලා දෙන්න ඕනේ. අපේ ගෙවල් ඔයා මීමුරේ ට්‍රිප් එක ගිහින් එනකොට දැක්ක නේ. ඒ ගෙදර හදන්න ඕනේ. මේ හැමදේට ම ටික කාලයක් ඕනේ තාරකා."

නමුත් ඒ කාලය මට දීමට ඇ෴ සූදානම් වූයේ නැත. ඇය මගේ ජීවිතෙන් ඈත් වුණේ ටිකෙන් ටික නොවේ. එක් වරට ය. හරියට තාරුකාවක් කඩා වැටෙනා සේ ම ය.

"සදීප්, අමාත්‍යංශයේ අකවුන්ටන් කෙනෙක් මට ප්‍රපෝසල් එකක් ගෙනාවා. එයාට කොළඹින් ගෙයක් තියනවා. වාහනයක් තියෙනවා. අපේ ගෙදරිනුත් කැමති යි. මං ඔයාට ඇති තරම් කල් දුන්න නේ. ඒත් තේරුමක් නෑ වගේ. මට තවත් බලාගෙන ඉන්න බෑ. ඔයා නිසා මට මගේ ජීවිතේ නාස්ති කර ගන්න බෑ. ඔයාගේ අරමුණුවලට ඔයා යන්න. මං මගේ ජීවිතේ හදාග න්නම්."

මීට දින තුනකට කලින් ඇය මට මේ ලෙස කෙටි පණිවිඩයකින් දන්වා තිබුණි. එය කියවන විට මට ඒ කිසිවක් අදහා ගත නොහැකි විය. මම ඒ මොහොතේ ම තාරකාට දුරකථන ඇමතුමක් ගත්ත ද ඒ මොහොතේ සිට මේ වන තුරු ඇයගේ දුරකථනය ක්‍රියාවිරහිත කර ඇත. මම ඇයගේ බෝඩිමට ගියේ ඇ෴ හමුවීමට ය. මා හමුවීමට අකැමැති වූ ඇ෴ මිතුරියක අත කියා එවුවේ දැන් සියල්ල අවසන් බවත්, කතා කිරීමට තරම් දෙයක් ඉතිරිව නැති බවත් ය. මෙතෙක් කල් මට පෙම්වතියක, සොයුරියක, මවක වී ළඟ උන් ඇ෴ වෙනස් වූයේ කෙසේ ද? මට සිතා ගත නොහැකි විය. සත්‍ය වශයෙන් ම මගේ වරදක් තිබේ ද? නැති නම් මා පෙර සිතූ ලෙස මගේ සමාජ ආර්ථික පසුබිම ඇයට හා නිවැසියන්ට ගැටලුවක් වූවා ද? නමුත් ඇ෴ කියනා ලෙස ඇය පිළිබඳ ව කිසිදු තැකීමක් කළේ නැති නම්, අපේ අනාගතය පිළිබඳ ව කල්පනා නොකළා නම් මම නොවේ ද වැරදි? එහෙත් මම හැකි සෑම දේ ම ඇ෴ වෙනුවෙන් කළෙමි.